# BUSINESS FOUNDATION & ITS ENVIRONMENT (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ව්‍යාපාර වර්ග කරන නිර්ණායක

- නිෂ්පාදනයේ ස්වභාවය අනුව
- හිමිකාරිත්වය අනුව/අයිතිය අනුව
- අරමුණ අනුව
- පරිමාණය අනුව
- නිෂ්පාදන අංශය අනුව /කර්මාන්ත මූලය අනුව

# ව්‍යාපාර වර්ගීකරණ ගැලීම් සටහනින්

ව්‍යාපාර වර්ගීකරණ පදනම්

- නිෂ්දපාදනයේ ස්වභාවය අනුව
  - ප්‍රාතමික
  - ද්විතීයික
  - තෘතියික
- හිමිකාරීත්වය අනුව
  - පෞද්ගලික
  - පොදු
- අරමුණ අනුව
  - ලාභ අරමුණු කරගත්
  - ලාභ අරමුණු කර නොගත්
- පරිමාණය අනුව
  - සුළු හා මධ්‍ය පරිමාණ
  - මහා පරිමාණ
- නිෂ්පාදන අංශය අනුව
  - කෘෂිකාර්මික
  - කාර්මික
  - සේවා

ClassWorkLK

# නිෂ්පාදනයේ ස්වභාවය අනුව ව්‍යාපාර

නිෂ්පාදනයේ ස්වභාවය අනුව ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික ලෙස ව්‍යාපාර වර්ගීකරණය කළ හැකි ය.

ඒ අනුව ස්වභාව ධර්මයෙන් ලැබී ඇති දේ ඒ ආකාරයෙන් ම ප්‍රයෝජනයට ගන්නා නිෂ්පාදන ව්‍යාපාර **ප්‍රාථමික අංශයටත්**, එම නිෂ්පාදන නැවත වෙනස් කිරීමට භාජනය කිරීමේ ව්‍යාපාර **ද්විතීයික අංශයටත්** සියලු ම සේවා සැපයීමේ ව්‍යාපාර **තෘතීයික අංශයටත්** අයත් වේ.

# නිෂ්පාදනයේ ස්වභාවය අනුව ප්‍රාථමික, ද්විතීයික, හා තෘතීයික ලෙස වර්ගීකරණය

## ප්‍රාථමික අංශය -

- කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය
- පතල් හා කැණීම් කර්මාන්තය

## ද්වීතීයික අංශය -

- නිෂ්පාදන කර්මාන්ත
- ඉදි කිරීම් කර්මාන්ත

ClassWork.LK

## <u>තෘතීයික අංශය -</u>

- විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම
- ජලය පිරිසිදු කිරීම හා බෙදාහැරීම
- මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම
- ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය
- වෙළෙඳාම, ප්‍රවාහන සේවා, නවාතැන් සැපයීම හා
- ආහාරපාන සැපයීම
- තොරතුරු සහ සන්නිවේදන කටයුත
- මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය හා දේපළ වෙළෙඳාම්
- වෘත්තීය ම ය සේවා සහ වෙනත් පෞද්ගලික සේවා
- රාජ්‍ය පරිපාලන, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය,
- සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවා

ClassWork.LK

## හිමිකාරිත්වය අනුව ව්‍යාපාර

හිමිකාරිත්වය අනුව පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා පොදු/රාජ්‍ය අංශයේ ව්‍යාපාර ලෙස ව්‍යාපාර වර්ග කළ හැකි ය.

## අරමුණ අනුව ව්‍යාපාර

අරමුණ අනුව ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර හා ලාභ අරමුණු කර නො ගත් ව්‍යාපාර ලෙස ව්‍යාපාර වර්ග කළ හැකි වේ.

## පරිමාණය අනුව ව්‍යාපාර

පරිමාණය අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙසත් මහා පරිමාණ ව්‍යාපාර ලෙසත් ව්‍යාපාර වර්ග කළ හැකි වේ.

## කර්මාන්ත මූලය අනුව ව්‍යාපාර

නිෂ්පාදන අංශ නැතිනම් කර්මාන්ත මූලය අනුව කෘෂිකාර්මික, කාර්මික හා සේවා ව්‍යාපාර ලෙස වර්ග කළ හැකි ය.

ClassWork.LK

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ පල කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015 ට අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය පහත දැක්වේ.

| ආර්ථීක කටයුතු | ද.දේ.නි.ට දායකත්වය (%) 2015 |
|---|---|
| කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය | 7.9 |
| ධාන්‍ය වගාව (වී හැර) | 0.2 |
| වී වගාව | 0.9 |
| එළවළු වගාව | 0.8 |
| උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 0.00 |
| පළතුරු වගාව | 0.6 |
| තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්,තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 0.8 |
| තේ වගාව | 0.8 |
| වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා, ආදී) | 0.0 |
| කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | 0.7 |
| රබර් වගාව | 0.3 |
| වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 0.2 |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 0.6 |
| පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන්) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 0.1 |
| වන වගාව, ගස් කැපීම, හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 0.6 |
| ධීවර කර්මාන්තය | 1.4 |
| **කර්මාන්ත** | **26.2** |
| පතල් හා කැණීම් කර්මාන්තය | 2.3 |
| නිෂ්පාදන කර්මාන්ත | 15.7 |
| විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 1.0 |
| ජලය පිරිසිදු කිරීම හා බෙදාහැරීම | 0.1 |
| මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම | |

ClassWork.Lk

| | |
|---|---|
| ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 0.3 |
| ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 6.8 |
| **සේවාවන්** | **56.6** |
| වෙළෙඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 23.2 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 0.6 |
| මූල්‍ය රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළෙඳාම | 12.3 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 11.8 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | |
| **මූලික මිලගණන් අනුව සමස්ත එකතු කළ අගය** | 8.7 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | 90.7 |
| **වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි)** | 9.3 |
| | 100.0 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව - 2015

ClassWork.LK

# නිෂ්පාදනයේ ස්වභාවය අනුව ව්‍යාපාර

නිෂ්පාදනයේ ස්වභාවය අනුව වර්ග කිරීමේ දී පතල් හා කැණීම් කර්මාන්තය ප්‍රාථමික අංශයට අයත් වන අතර කර්මාන්ත මූලය අනුව වර්ග කිරීමේ දී පතල් හා කැනීම් කර්මාන්තය කාර්මික අංශයට (කර්මාන්ත අංශයට ) අයත් වේ.

එසේ ම නිෂ්පාදනයේ ස්වභාවය අනුව විදුලිය, ගෑස් වාෂ්ප හා වායු සමීකරණ සැපයීම, ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම, මලාපවාහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය තෘතීයික අංශයට අයත් වුව ද කර්මාන්ත මූලා‍ය අනුව ඒවා කාර්මික අංශයට අයත් වේ.

දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් අංශයෙන් වන දායකත්වය ප්‍රතිශතයක් ලෙසද ඉදිරිපත් කළ හැකි ය.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura